**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**

**Sabaragamuwa Provincial Department of Education**

**තෙවන වාර පරීක්ෂණය 2017** | **10 ශ්‍රේණිය**

**மூன்றாம் தவணைப் பரீட்சை 2017** | **தரம் 10**

**Third Team Test 2017** | **Grade 10**

**බුද්ධ ධර්මය I**

**Buddhist I**

**පැය එකයි**

**One hours**

**නම/විභාග අංකය : ....................................................................**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුරු තෝරන්න.**

1. සිදුහත් බෝසතාණන් වහන්සේ "කිං කුසල ගවේෂීව" ගතකළ කාලය
   1. වසර 6 කි
   2. වසර 35 කි
   3. වසර 13 කි
   4. වසර 45 කි

2. සිදුහත් බෝසත් සිරිත අභියෝග රැසකින් පිරී පැවතුනකි. මහා අභිනිෂ්ක්‍රමණය ඒ නමින් හැඳින්වෙන්නේ,
   1. ගිහිගෙය අතැරයාම රජපවුලට බරපතල ගැටලුවක් නිසාය.
   2. රජපවුලේ උපන් අයෙකු ගිහගෙය අතැර යාම නිසා.
   3. කම්සැප අතැරයාම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන නිසාය.
   4. බෝසත්වරයෙකු බුද්ධත්වය වෙනුවෙන් ගිහිගෙය අතහැර යාම නිසා.

3. ත්‍රිවිධ රත්නය අතුරින් ලොව මුලින්ම පහළ වූයේ,
   1. බුද්ධ රත්නයයි
   2. ධම්ම රත්නයයි
   3. බුද්ධ රත්නය හා ධම්ම රත්නයයි
   4. බුද්ධ රත්නය හා සංඝරත්නය යි

4. ගැබිණි මාතාවන්ගේ දරු ප්‍රසූතිය පහසු කිරීම සඳහා දේශනා කරන පිරිත,
   1. වැසි පිරිතයි
   2. ජය පිරිතයි
   3. ධජග්ග පිරිතයි
   4. අංගුලිමාල පිරිතයි

5. ආර්ය සත්‍ය අවබෝධ කොටගෙන සසරින් එතෙරවීමට මං පෙත් විවර වනුයේ අවබෝධයෙන් යුක්තව තෙරුවන් සරණ යෑමෙන්ය. ඒ අනුව තෙරුවන් ගුණ
   1. 21 කි
   2. 22 කි
   3. 23 කි
   4. 24 කි

6. විවිධ කරුණු පිළිබඳ සිතේ ඇතිවන සැකය විචිකිච්ඡාව නම් වේ. එය උපමා කරන්නේ,

1. පාසි සහිත ජලයටය
2. බොර ජලයටය
3. උතුරන ජලයටය
4. කැළඹුණු ජලයටය

7. සමථ භාවනාව වැඩීම ධ්‍යාන ශක්තීන් උපදවා ගැනීමට මෙන්ම දෛනික ජීවිතයකට ප්‍රයෝජන සපයයි. ඒ අතර වඩා වැදගත් වන්නේ,

1. පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති ලබාගත හැකි වීමයි.
2. අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇතිවීමයි
3. කීර්තිය පැතිර යාමයි
4. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබීමයි.

8. සතර මහා භූත රූපවල එකතුව රූප ස්කන්ධය යි. සතර මහා භූත රූප නම්,

1. නීල, පීත, ලෝහිත, ඕදාත යි
2. රූප, ශබ්ද, ගන්ධ, රස යි
3. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යි
4. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර යි

9. නැගිට ගැනීමටවත්  බැරිතරමට කෑම ගෙන එහිම පෙරළී සිටින තැනැත්තා බෞද්ධ සාහිත්‍යයෙහි දක්වන්නේ,

1. භුත්තවමිතක නමිනි
2. තත්ථාවට්ටක නමිනි
3. කාකමාසක නමිනි
4. ආහාර හත්තක නමිනි

10. පොදුවේ ගත්කල සෑම සංගායනාවකින්ම සමාජයට වැදගත් ආදර්ශ ලබාදේ. ඒ අනුව වඩාත්ම වැදගත් කරුණ නම්,

1. ඕනෑම ගැටලුවකදී සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් ලබාගැනීමට හැකි බවයි.
2. සසුනේ ඇතිවන ඕනෑම ගැටලුවකදී සංගායනා කළයුතු බවයි.
3. සංගායනා කිරීම තුළින් ඕනෑම දෙයක් සුරක්ෂිත කරගතහැකි බවයි.
4. සුරක්ෂිත කළයුතු දෑ නිසි කල සුරක්ෂිත කිරීමෙන් සෑම ගැටලුවක්ම නිරාකරණය කරගත හැකි බවයි.

11. අනුරාධපුර යුගයට අයත් බෞද්ධ සිතුවම් දක්නට ලැබෙන ස්ථානයක් වන්නේ,

1. තිවංක පිළිම ගෙයයි
2. රිදී විහාරයයි
3. හිඳගල විහාරයයි
4. අනුරාධපුර බිසෝ මාලිගය යි

12. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ වර්ණනා වන "අමෘතවහ" නම් කෘතිය විද්‍යාචක්‍රවර්තීන් විසින් රචිතය. එය,

1. අමාවතුර ලෙස ද හැඳින්වේ
2. බුත්සරණ ලෙස ද හැඳින්වේ
3. ධර්මප්‍රදීපිකාව ලෙස ද හැඳින්වේ
4. මුවදෙව්දාවත ලෙස ද හැඳින්වේ

13. සිංහල බෞද්ධ සාහිත්‍යය තුළ දඹදෙණි යුගයට අයත් කාව්‍ය ග්‍රන්ථයක් වන්නේ,

1. පූජාවලිය යි
2. අමාවතුරයි
3. බුත්සරණයි
4. කව්සිළුමිණයි

14. තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පිංපොතේ සටහන් කළේ,

1. අනගාරික ධර්මපාල තුමාය
2. දුටුගැමුණු මහරජුය
3. වැලිවිට සරණංකර හිමිය
4. රේරුකානේ චන්දවිමල හිමිය

15. සැබෑ ආගමික සහජීවනය යන්නේ අදහස් වන්නේ,

1. අන්‍ය ආගමික උත්සව තමන් විසින් පැවැත්වීමයි.
2. අන්‍යාගමිකයින්ට තම ආගමික කටයුතු නිදහසේ කර ගැනීමට ඉඩ සැලසීමයි.
3. සමගිය වෙනුවෙන් සෑම ආගමක්ම එක සමාන බව සිතා කටයුතු කිරීමයි.
4. තම ආගමික කටයුතුවලට අන්‍යාගමිකයින්ද සහභාගී කරවා ගැනිමයි.

16. "ඉමස්මිං අසති ඉදං න හෝති" මෙම සූත්‍ර පාඨයෙහි අදහස,

1. මෙය නැති කල්හි මෙය නොවේ.
2. මෙය නැති වී යෑමෙන් මෙය නැතිව යයි
3. මෙය ඉපදීමෙන් මෙය උපදී
4. මෙය ඇති කල්හි මෙය වෙයි

17. තමා විසින්ම පිළිපැද ඇස්පනාපිට මෙලොව ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්ම රත්නය,

1. අකාලික වේ
2. ඒහිපස්සික වේ
3. සන්දිට්ඨික වේ
4. ඕපනයික වේ

18. හිදීම, සිටීම, ඇවිදීම ආදි සියලු ක්‍රියාවන්හිදී අවබෝධයෙන් යුක්තවීම,

1. ඉන්ද්‍රිය සංවරයයි
2. සති සම්පජඤ්ඤයි
3. සන්තුට්ඨිතාවයයි
4. අල්පේච්ඡතාවයි

19. සීලය පුද්ගලයාගේ චරිත සංවර්ධනයට උපකාරී වන්නකි. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහකි. ඒ අතරට අයත් නොවන්නේ,

1. කීර්තිය පැතිරීමයි
2. මරණින් මතු සුගතියෙහි උපත ලැබීමයි
3. සිහිමුලා නොවී කලුරිය කිරීමයි
4. හොඳ මතක ශක්තියක් ලැබීමයි

20. සදිසා නමස්කාරයෙහි "මාතා පිතා දිසා පුබ්බා ආචාරියා දක්ඛිණා දිසා" යනාදී ගාථාවේ සඳහන් "ආචරියා දක්ඛිණා දිසා" යන පාලි පාඨයෙහි අර්ථය වන්නේ,

1. දකුණු දිශාවෙන් මිතුරන් සංකේතවත් වන බවයි.
2. දකුණු දිශාවෙන් ගුරුවරුන් සංකේතවත් වන බවයි.
3. දකුණු දිශාවෙන් මව්පියන් සංකේතවත් බව බවයි.
4. දකුණු දිශාවෙන් පැවිදි උතුමන් සංකේතවත් වන බවයි.

21. දුප්පත්-පොහොසත්, ප්‍රඥාව අඩු ප්‍රඥාවන්ත යනාදී වශයෙන් සමාජය තුළ දක්නට ලැබෙන පුද්ගල විවිධත්වය දකින විට අපට සිහිපත් වන්නේ,

1. රතන සූත්‍ර දේශනාවයි
2. පරාභව සූත්‍ර දේශනාවයි
3. මහා මංගල සූත්‍ර දේශනාවයි
4. චූල්ලකම්ම විභාංග සූත්‍ර දේශනාවයි

22. තම නිවසේ සුරතලයට ඇති දැඩිකළ බලු පැටියා මරණයට පත් වූ නිසා හඬ වැළපෙන තම කුඩා පුතු දෙස බලා සිරිසේන තේරුම්ගත් දහම,

1. චතුරාර්ය සත්‍ය දහමයි
2. පටිච්ච සමුප්පාද දහමයි
3. තිලකුණු දහමයි
4. පුනර්භව දහමයි

23. "බැමිණිතියා සාය" නිසා බුද්ධ ශාසනයට සිදු වූ හානි හේතු කොටගෙන තෙරුණ් වහන්සේලාට පැහැදිලි වූ ප්‍රධාන කරුණකි.

1. රජවරුන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම ශාසනයට හානිකර බව
2. ත්‍රිපිටක ධර්මය වාචෝද්ගතව පවත්වාගන යාම අනාරක්ෂිත බව
3. භික්ෂූන් වහන්සේලා දුසිල්වත්වීම වළකා ගතයුතු බව
4. ග්‍රන්ථ ධූරය හා විදර්ශනා ධූරය වඩන භික්ෂූන් සමග කළ යුතු බව.

24. ධර්මය ඇසුරු කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට බුහුමන් කරමින් ලෙස රජකම කළයුතුය. මෙලෙස සඳහන්වන බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය වන්නේ,

1. දසරාජ ධර්ම ප්‍රතිපත්තිය යි
2. සප්ත අපරිහාණිය ධර්ම ප්‍රතිපත්තිය යි
3. දස සක්විතිවත් ප්‍රතිපත්තිය යි
4. දස අගතියෙන් තොරව ක්‍රියා කිරීමේ ප්‍රතිපත්තිය යි

25. ගිහියෙක් වෙළඳාම තම දැහැමි ජීවන වෘත්තියක් ලෙස කරයි. මෙම ක්‍රියාව හඳුන්වන්නේ,

1. සම්මා කම්මන්ත ලෙසය
2. සම්මා ආජීව ලෙසය
3. සම්මා වායාම ලෙසය
4. සම්මා දිට්ඨි ලෙසය

26. මිනිසා මෙන්ම සතා සිව්පාවෝද පරිසර ජීවීහු වෙති. එබැවින්ම අපි පරිසරය රැකිය යුතු වෙමු. එහිදී ජල දූෂණය වැළැක්වීමට බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට මග පෙන්වූයේ,

1. පෙරහන් කඩක් භාවිත කරන ලෙස දේශනා කිරීමෙනි
2. පරිසරයට කැලි කසල මුදා නොහරින ලෙස දේශනා කිරීමෙනි
3. ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන ලෙස දේශනා කිරීමෙනි
4. ජලයට අපවිත්‍ර දෑ දැමීම නොකළ යුතු බව දේශනා කිරීමෙනි.

27. පුද්ගලයෙකු තුළ විමසුම්ශීලි බුද්ධිය, අධිෂ්ඨානය, ඉවසීම, ආත්ම සංයමය, නොපසුබස්නා උත්සහය, හා උපායශීලි බව තිබේ නම් ඔහු තුළ,

1. ථිනමිද්ධ වැඩේ
2. අභිධ්‍යාව වැඩේ
3. ඡන්දය වැඩේ
4. යසස වැඩේ

28. "සමගිකම යහපති" යන අදහස ඇතුළත් උතුම් බුදු වදන වන්නේ,

1. "සමවායො එව සාධු" යන්නයි
2. "සමග්ගාභෝථ මා විවදථ" යන්නයි
3. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන්නයි
4. "ආරෝග්‍ය පරමාලාභා" යන්නයි

29. "කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම" පිළිබඳ සඳහන් වන බෞද්ධ රාජ්‍ය පාලන ඉගැන්වීම වන්නේ,

1. දස පින් කිරියවත්ථ
2. සප්ත අපරිහාණීය ධර්මය
3. පංචසීල ප්‍රතිපදාවයි
4. සතර සංග්‍රහ වස්තුවයි

30. සසර දුකින් නිදහස් වනතුරු නිවන් දක්නා ජාති දක්වා යම්කිසි භවයකදී විපාක දීමට ඉදිරිපත් වන්නේ,

1. දිට්ඨධම්මවේදීනය කර්මයයි
2. උප්පජ්ජවේදනීය කර්මයයි
3. අපරාපරියවේදනීය කර්මයයි
4. අහෝසි කර්මයයි

31. ස්ථූපයක ආරක්ෂාවට ස්තූපය වට කොට තනා ඇති ගොඩනැගිල්ල,

1. පධානඝර නම් වේ
2. චෛතියඝර නම් වේ
3. පටිමා ඝර නම් වේ
4. වාහල්කඩ නම් වේ

32. ශ්‍රී ලාංකික ඉතිහාසයේ භික්ෂු සංඝයාට පොදුවේ ආරාම පූජාකරනු ලැබුවද පළමු වරට පෞද්ගලික ආරාම පූජාවක් කරනු ලැබුයේ,

1. දුටුගැමුණු රජුය
2. කාවන්තිස්ස රජුය
3. වලගම්බා රජුය
4. මහසෙන් රජුය

33. නිවන් මුහුණුවර ආරක්ෂා වන පරිදි ඉගෙනීම ක්‍රීඩාව රැකියාව සහ එදිනෙදා කටයුතු යනාදිය ඉටුකිරීමේදී බෞද්ධයාට ගැළපෙන පිළිවෙල වන්නේ,

1. උපරිම ලාභ ලැබෙන පරිදි ඒවා සිදු කිරීමයි
2. කාර්යක්ෂමතාව උපරිම වන පරිදි ක්‍රියා කිරීමයි
3. තනි තනිව තමාගේ ශක්ති පමණට වැඩ කිරීමයි
4. නිවැරදි ආකල්ප සහිතව කටයුතු ඉටු කිරීමයි

34. අනුන්ගේ සිත් දැනගැනීමට ඇති ශක්තිය හඳුන්වන නම,

1. පුබ්බේනිවාසානුස්සති ඥානයි
2. ආසවක්‍ෂය ඥානයි
3. චුතුපපාත ඥානයි
4. පරචිත්ත විජානන ඥානයි

35. බුද්ධ කාලයේ පැවති සමුහාණ්ඩු පාලනයට උදාහරණයකි.

1. මගධ රාජධානියයි
2. කෝසල රාජධානියයි
3. වජ්ජි රාජධානියයි
4. වත්ස රාජධානියයි

36. රටක ජනතාව විවිධ කුල, ජාති, ආගම්, භාෂා අනුව වර්ග වී සිටියද, ඒ සියලු දෙනා කෙරෙහි සමසිතින් කටයුතු කිරීම.

1. මෛත්තාවයි
2. අර්ථචර්යාවයි
3. මුදිතාවයි
4. සමානාත්මතාවයි

37. ආනන්ද තෙරුණ් වහන්සේ පිදුම්ලද තනතුරක් නොවන්නේ,

1. ප්‍රඥාවන්තයින් අතර අග තනතුර
2. අග්‍ර උපස්ථායක තනතුර
3. බහුශ්‍රැතයින් අතර අග තනතුර
4. ධර්මභාණ්ඩාගාරික තනතුර

38. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සහයෙන් කටයුතු කිරීමේදී තමන්ට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම මගහැරේ, මෙය

1. ගති සම්පත්තියයි
2. උපධි සම්පත්තියයි
3. කාල සම්පත්තියයි
4. ප්‍රයෝග සම්පත්තියයි

39. අලුත් අවුරුදු උත්සවය සැමරීමේදී විශේෂ ස්ථානයක් ලැබෙන්නේ වැඩිහිටියන් හා දෙමාපියන් කමාකර ගැනීමටයි. මෙමගින් පැහැදිලි වන්නේ අපේ ,

1. සිරිත් විරිත්වලට මුල්තැන දීමයි
2. වැඩිහිටියන්ට ගරු කිරීමයි
3. සහජීවන සංකල්පයයි
4. අලුත් අවුරුද්දට ඇති කැමැත්තයි

40. දේවානම්පියතිස්ස රජදවස ඉදිකළ මහා විහාරය අංග සම්පූර්ණ ගොඩනැගිල්ල සහිත සුවිසල් බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත්කළ ශ්‍රේෂ්ඨ උත්තමයා,

1. දුටුගැමුණු මහ රජතුමාය
2. දෙවනපැතිස් රජතුමාය
3. අනගාරික ධර්මපාල තුමාය
4. හයවන මහා පරාක්‍රමබාහු රජතුමා

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය 2017 | 10 ශ්‍රේණිය

மூன்றாம் தவணைப் பரீட்சை 2017 | தரம் 10

**Third Team Test 2017** | **Grade 10**

බුද්ධ ධර්මය **II**

**Buddhist II**

පැය දෙකයි

**Two hours**

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමි වේ.**

(01). i. අප අවට පරිසරය දෙයාකාරය. එම කොටස් දෙක නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි පැවිදි පිරිස විසින් අත්හළ යුතු අන්ත දෙක මොනවාද?

iii. ශ්‍රද්ධාවෙහි මූලික කොටස් දෙක නම් කරන්න.

iv. මෙම ජාතක කතා මුලාශ්‍ර කොටගෙන රචනා කරන ලද කාව්‍ය කෘති 02 ලියන්න.

(අ) මඛාදේව ජාතකය (ආ) කුස ජාතකය

v. ස්තූපය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

vi. අවිධිමත් හා ගිජු ලෙස ආහාර අනුභව කරන 05 දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඉන් දෙදෙනක් ලියන්න.

vii. බුදුරදුන් සතු වූ උපත හා මරණය ගැන ගැනීමට හැකි ඥාණය හඳුන්වන්නේ කුමන නමින්ද?

viii. ලෝකය තුළ වෙසෙන්නේ උඩුගම් සහ යටිගම් බලා ගමන් ගන්නා දෙපිරිසකි. බුදු දහමේ මෙම දෙපිරිස හැඳින්වීමට යොදන වචන මොනවාද?

ix. "ඉමස්මිං සති ඉදං හෝති" හි සරල අදහස ලියන්න.

x. සතර අගතී වලින් දෙකක් ලියන්න.

(02). i. දෙවෙනි ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්නම හේතුව කෙටියෙන් ලියන්න. (ලකුණු 02)

ii. දෙවෙනි ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක් වූ රජතුමා මූලිකත්වය ගත් රහතන් වහන්සේ සහ එය පැවැත්වූ ස්ථානය නම් කරන්න. (ලකුණු 03)

iii. දෙවෙනි ධර්ම සංගායනාව මගින් බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ඇති වූ අකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03). i. බුදුරජාණන් වහන්සේ විසින් සීමාව හා ප්‍රමාණය දැන ආහාර අනුභව කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේ කා හටද? එය සඳහන් වන සූත්‍රය කුමක්ද? (ලකුණු 02)

ii. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ආකාරයට අවිධිමත් ලෙස ආහාර අනුභව කරන්නන් පත් දෙනා නම් කරන්න. (ලකුණු 03)

iii. ශිෂ්ඨ සම්පන්න ලෙසත් සෞඛ්‍ය සම්පන්න ලෙසත් ආහාර ගැනීම උදෙසා සේඛිය ධර්ම ගිහියාට වැදගත් වන ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 05)

(04). i. දස අකුසල් අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. දස අකුසල් කර්ම තිදොරට බෙදා දක්වන්න. (ලකුණු 03)

iii. දැහැමි මිත්‍රශීලි සමාජයක් ඇති වීමට දස අකුසලින් වෙන්විය යුතු ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05). i. දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩෙන පිළිවෙලත් පැහැදිලි කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)

iii. සාමකාමී සමාජයක් ඇති කරලීම උදෙසා ධම්මපද දේශනාවන් ඉවහල් වන ආකාරය නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 05)

(06). i. බුදුරජාණන් වහන්සේ අන්‍යෝන්‍ය වශයෙන් තම යුතුකම් ඉටු කළ යුතුයැයි දේශනා කළ සමාජ කණ්ඩායම් අතුරෙන් දෙකක් නම් කරන්න (ලකුණු 02)

ii. ඉහත සූත්‍රයේදී දූ දරුවන් විසින් තම දෙමාපියන්ට ඉටුකළ යුතු යැයි දේශනා කළ යුතුකම් අතරින් තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. සදිසා නමස්කාරය තුළින් පැහැදිලි කරන සමාජ සම්බන්ධතාවල ධාර්මික සැකැස්ම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07). පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළබඳව කෙටි සටහන් ලියන්න.

i. පටිච්ච සමුප්පාදය (ලකුණු 02)

ii. බෞද්ධ සාහිත්‍යය (ලකුණු 03)

iii. අනුරාධපුර හා පොළොන්නරු චිත්‍ර (ලකුණු 05)

iv. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමි (ලකුණු 05)